# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA



| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2026.02.27 |


## 2026 ජනවාරි මාසයේ දී ඉදිකිරීම් කටයුතු සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.

**ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, 2026 ජනවාරි මාසයේ දී දර්ශකාංක 75.0ක් දක්වා ඉහළ ගිය අතර, එය 2020 ජූලි මාසයේ දී වාර්තා වූ 75.7ක උපරිම අගයෙන් පසු වාර්තාගත දෙවන ඉහළම අගය වේ.** 2026 වසර ආරම්භය සමග නව ඉදිකිරීම් ව්‍යාපෘති ආරම්භ වීම හා කාලගුණික තත්ත්වය වඩා යහපත් වීම ජනවාරි මාසය තුළ ඉදිකිරීම් ක්‍රියාකාරකම් ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය.

ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)

**75.0**

2026 ජනවාරි

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ බොහෝ අංශවල ව්‍යාපෘති සුලබ වීම හේතුවෙන් නව ඇණවුම් දර්ශකය ජනවාරි මාසයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, සේවක බඳවාගැනීම් ඉහළ යෑම පෙන්නුම් කරමින් සේවා නියුක්ති දර්ශකය ද මාසය තුළ දී ඉහළ ගියේය. කෙසේ වෙතත්, විවිධ නිපුණතා කාණ්ඩ සඳහා පුහුණු සේවකයන් බඳවා ගැනීමේදී නිරන්තරයෙන් පවතින අභියෝග පිළිබඳව බොහෝ ආයතන විසින් අවධාරණය කරන ලදී. සැලසුම් කළ ව්‍යාපෘති සඳහා තොග රැස්කර ගැනීම හේතුවෙන් තොග මිලදී ගැනුම් දර්ශකය ද ජනවාරි මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මෙම මාසය තුළ ද ඉහළ මට්ටමක පැවතුණි.

ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | 2025 දෙසැ. | 2026 ජන. | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)** | **67.1** | **75.0** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| නව ඇණවුම් | 67.6 | 77.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 50.0 | 54.2 | + | කඩඉම් **මට්ටමේ** සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 54.2 | 65.3 | + | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 56.9 | 54.2 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ව්‍යාපෘති ආරම්භ වීම පිළිබඳ අපේක්ෂා හේතුවෙන් ඉදිරි මාස තුන තුළ ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල අඛණ්ඩ වර්ධනයක් අපේක්ෂා කරනු ලැබෙයි.

### ගෝලීය ප්‍රවණතා

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| ප්‍රංශය | අඩු වේගයකින් පහත වැටීමක් |
| ජර්මනිය | ඉහළ යෑමක සිට පහත වැටීමක් |
| අයර්ලන්තය | අඩු වේගයකින් පහත වැටීමක් |
| ඉතාලිය | වැඩි වේගයකින් පහත වැටීමක් |
| එක්සත් රාජධානිය | අඩු වේගයකින් පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 පෙබරවාරි 27 වන දිනට*

[1] එස්&පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මාසික ප්‍රතිචාර 35ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ෂව අදාළ මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන
තොග මිලදී ගැනුම් : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය
ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය
අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.